**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව - 2019**

-----------------------------------------------------------

## 1.1 මතය

------

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයෙන් මෙම වාර්තාවේ දැක්වේ.

2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසය යි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තව ද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේ දී හා තක්සේරු කිරීමේ දී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදු වන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකි ය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාලවකවානුවල දී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීතිරීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 128 (1) (ජ) | | | |
| | සභාවේ නිලධාරින් පස්දෙනෙක් සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර හිමිකම් ලැබීමට නියමිත දිනට ආසන්න වශයෙන් වසර 01 ත් 06 ත් අතර කාලයකට පෙර පළමු බලපත්‍රය ලබා ගෙන තිබුණි. මෙ | අධිකරණ එකඟතාවය අනුව ඉහත බලපත්‍ර ලබා දීම වැරදි බව තහවුරු නොවන බැවින් ඒ සම්බන්ධව වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට හැකියාවක් නොමැති බවත් මේ | මුදල් රෙගුලාසි 128 (1) (ජ) ප්‍රකාරව එය නිවැරදි කිරීමට කටයුතු කළ යුතු අතර අධිකරණයේ එකඟත්වය ලබා ගැනීමට කටයුතු |

සම්බන්ධව පසුගිය වර්ෂයේ විගණන වාර්තාවෙන් ද පෙන්වා දී තිබූ අතර ආයතනයේ ගණන්දීමේ නිලධාරියා මුදල් රෙගුලාසි 128 (1) (ජ) ප්‍රකාරව එය නිවැරදි කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. SC.FR.662/2010 දරන නඩුවේ දී ඇති එකඟත්වයට අනුව එය නිවැරදි බව කළමනාකරණය පැවසුව ද මෙම නඩුවේ දී පැමිණිලිකාර පාර්ශවය සමඟ මණ්ඩලය එකඟතාවයට පැමිණීමේ දී නඩුවේ වගඋත්තරකරුවන්ගේ එකඟත්වය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ඇනුමැතිය ලබා ගෙන නොතිබුණි.

ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රජයේ අයිතිවාසිකම්වලට හානිදායක නොවන ආකාරයෙන් කටයුතු කර ඇති බව විගණනයේ දි නිරීක්ෂණය නොවීය. තවද, 2016 වර්ෂයේදී එකඟතාවයට පැමිණි ඉහත නඩුව සහනදායි මෝටර් රථ බලපත්‍ර ලබා දීම සම්බන්ධව ගොනු කළ නඩුවක් නොවන අතර සභාවේ නිලධාරින්ට සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාදීම, මෙම නඩුවේ එකඟතාවයට පෙර සිදු වී තිබුණි.

සම්බන්ධව යම් පාර්ශවයක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත නැවත කරුණු ඉදිරිපත් කිරීමක් සිදු කර ලබා ගන්නා වූ තීරණ හා උපදෙස් අනුව ඉදිරියේ දී නියාමන සභාවට කටයුතු කළ හැකි බවත් දන්වමි.

කිරීමේ දී අදාළ අනුමැතියන් සහ රජයේ අයිතිවාසිකම් පිළිබඳ දැඩිව අවදානය යොමු කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| (ආ) 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 58 වන වගන්තිය | ජාතික ආපදා මෙහෙයුම් සැලැස්ම තුළ න්‍යෂ්ටික හෝ විකිරණ අනතුරක දී ප්‍රතිචාර දැක්වීමේ දී හඳුනා ගනු ලැබූ ප්‍රධාන තාක්ෂණික ආයතනය වන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් "ජාතික න්‍යෂ්ටික හා විකිරණශීලී හදිසි අවස්ථා කළමනාකරණ සැලැස්ම" සකස් කළ යුතුය. නමුත් මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් එනම් පවතින පනත සම්මත වී වසර 05 කට අධික කාලයක් ඉකුත් වී තිබුණ ද, එවැනි සැලැස්මක් සකස් කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | ජාතික න්‍යෂ්ටික හා විකිරණශීලී හදිසි අවස්ථා කළමනාකරණ සැලැස්ම අදාළ සියළු පාර්ශවයන්ගේ අදහස් හා යෝජනා අනුව සකස් කර අවසන් සමාලෝචනයට ද ලක් කර අනුමැතිය සඳහා ජාතික ආපදා කළමනාකරණ කවුන්සිලය වෙත යොමු කර ඇත. මීලඟ පළමු ජාතික ආපදා කළමනාකරණ කවුන්සිලයේ රැස්වීම් වාරයට එය ඉදිරිපත් කිරීමට නියමිත ය. මෙම රැස්වීම් පැවැත්වීමේ දිනයන් තීරණය කරනු ලබන්නේ අතිගරු ජනාධිපතිතුමාගේ සභාපතීත්වයෙන් යුතු ජාතික ආපදා කළමනාකරණ කවුන්සිලය මඟින් නිසා එය අපගේ පාලනයෙන් තොරව සිදු වන ක්‍රියාවලියකි. | 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 58 වන වගන්තිය අනුව ජාතික න්‍යෂ්ටික හා විකිරණශීලී හදිසි අවස්ථා කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේ කටයුතු හැකි ඉක්මනින් අවසන් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

මෙහෙයුම් ප්‍රතිඵලය රු. 8,874,702 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,258,188 ක් විය. මේ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 7,616,514 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මුළු වියදම රු. 5,749,545 කින් වැඩිවීම හා ආදායම රු. 1,866,969 කින් අඩු වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 03 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2016 වර්ෂයේ ඌනතාවය රු. 973,993 ක් ද 2017 වර්ෂයේ රු. 3,102,117 ක ඌනතාවයක් ද වූ අතර, එය 2018 වර්ෂයේ දී රු. 1,258,188 ක් විය. එය සමාලෝචිත වර්ෂයේ දී රු. 8,874,702 ක් දක්වා වැඩි වී තිබුණි. බදු පෙර මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය නැවත ගැලපීමෙන් පසු නියාමන සභාවේ 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා දායකත්වය පිළිවෙලින් රු. 18,904,956 ක්, රු. 23,135,332 ක්, රු. 31,557,636 ක් සහ රු. 28,744,518 ක් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)අයනීකාර විකිරණ සම්බන්ධිත ක්‍රියා පිළිවෙත් නියාමනය කිරීම සහ පාලනය කිරීම තුළින් අයනීකාර විකිරණයෙන් විය හැකි හානි කර බලපෑම්වලින් පොදු මහජනතාව, රෝගීන්, විකිරණ ශ්‍රමිකයන් හා පරිසරය ආරක්ෂා කර ගැනීමේ වගකීම තහවුරු කර ගැනීම සඳහා 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ නියාමන සභාව ඉටු කළ යුතු පනතේ II පරිච්ඡේදයේ 11 වන වගන්තිය යටතේ දක්වා ඇති පහත කාර්යයන් ප්‍රමාණවත් පරිදි ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය. | | |

| | | | |
|---|---|---|---|
| (i) | නියැදි පදනමක් මත ගම්පහ හා මහනුවර දිස්ත්‍රික්ක ආශ්‍රිතව ආයතන 19 ක සිදු කළ භෞතික විගණන පරීක්ෂාවේ දී අයනීකාර විකිරණ සම්බන්ධිත ක්‍රියාපිළිවෙත් නියාමනය කිරිම හා පාලනය කිරීම ප්‍රමාණවත් පරිදි ඉටු වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | පෙන්වා දී ඇති විගණන නිරීක්ෂණ නිවැරදි වේ. දැනටමත් ඇතැම් කරුණු නිවැරදි කිරීමට පියවර ගෙන ඇති අතර අනෙක් ඒවාද ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. මීට අමතරව කාර්යයන් ඉටු කිරීමේ දී දැනට සිටින නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවේ. කෙසේ නමුත් ඉදිරියේ දී අවශ්‍යතාවය අනුව අවදානම් වැඩි සහ මධ්‍ය අවදානම් ඇති යන්ත්‍ර සඳහා ප්‍රමුඛත්වය දෙමින් පවතින සම්පත් ප්‍රමාණය සැලකිල්ලට ගෙන විකිරණ යන්ත්‍ර පරීක්ෂා කිරීම් සිදු කිරීමට සටහන් කර ගත්තෙමි. | 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ නියාමන සභාව ඉටු කළ යුතු පනතේ II පරිච්ඡේදයේ 11 වන වගන්තිය යටතේ දක්වා ඇති පහත කාර්යයන් ප්‍රමාණවත් පරිදි ඉටු කළ යුතුය.<br><br>(අ) මේ පනත යටතේ නිකුත්කිරීමට නියමිත බලපත්‍ර නිකුත්කිරීම සහ එම බලපත්‍ර අළුත් කිරීම, වෙනස් කිරීම, අත්හිටුවීම හෝ අහෝසි කිරීම,<br><br>(ආ) මේ පනත යටතේ පැනවෙන නියමයන්ට සහ මේ පනත යටතේ නිකුත් කළ බලපත්‍රවල සඳහන් කොන්දේසිවලට අනුකූලතාවය දක්වන බව තහවුරු කිරීම පිණිස සෝදිසි කිරීමේ වැඩසටහන් සකස් කිරීම.<br><br>(ඇ) මේ පනතේ විධිවිධානවලට යථා පරිදි අනුකූලතාවය දක්වන බව, මේ පනත යටතේ සාදන ලද රෙගුලාසි හෝ රීති සහ නිකුත් කළ බලපත්‍රවල සඳහන් කොන්දේසි නිසිලෙස බලාත්මක කරන බව තහවුරු කිරීමට යෝග්‍ය පියවර ගැනීම. |
| (ii) | පනතේ 11 (උ) වගන්තිය අනුව විකිරණ ආරක්ෂාව සහ අයනීකාර විකිරණ යොදා ගැනීම සම්බන්ධයෙන් වූ රීති, සංග්‍රහ සහ ප්‍රමිති සකස් කිරීම සභාවේ ප්‍රධාන කාර්යයක් ලෙස දක්වා තිබුණ නමුත් නියාමන සභාව ආරම්භ වී වසර 05 ක් ගත වී තිබුණ ද විකිරණ සුරක්ෂිතතාවය සම්බන්ධ නියෝග සකස් කරමින් පැවතුණි. | සුරක්ෂිතතාවය සම්බන්ධ නියෝග දැනට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව මඟින් සමාලෝචනය කර නියාමන සභාව වෙත එවූ අතර එම නියෝග අපගේ නිරීක්ෂණ සහිතව අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. විකිරණ සුරක්ෂිතතාවය යනු අළුත් ක්ෂේත්‍රයක් වන අතර මෙම අවශ්‍යතාවය පැන නැගුණේද දැනට අවුරුදු 02 කට පමණ ඉහත දී ය. | 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ නියාමන සභාව ඉටු කළ යුතු පනතේ II පරිච්ඡේදයේ 11 (උ) වගන්තිය අනුව විකිරණ ආරක්ෂාව සහ අයනීකාර විකිරණ යොදා ගැනීම සම්බන්ධයෙන් වූ රීති සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (iii) පනතේ 11 (ඊ) වගන්තිය අනුව අයනීකාර විකිරණයෙන් ආරක්ෂා වීම, ප්‍රභවයන් සහ වෙනත් විකිරණශීලි ද්‍රව්‍යයන්හි ප්‍රවේසම හා සුරක්ෂිතතාවය සහ විකිරණශීලි අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සහ ක්‍රමෝපායක් සකස් කිරීම පිළිබඳව අමාත්‍යවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම සභාවේ ප්‍රධාන කාර්යයක් ලෙස දක්වා ඇත. එසේ වුවද, මෙම ප්‍රතිපත්තිය සකස් කිරීමේ කටයුතු මේ වන විටත් මූලික කෙටුම්පත් අවස්ථාවේ පැවති අතර, පනත සම්මත වී වසර 05 කට අධික කාලයක් ගත වී තිබුණ ද, මෙම කටයුතු ඉටුකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | නියාමන සභාව විසින් මෙම මූලික කෙටුම්පත සකස් කර ඇතත් මේ ක්ෂේත්‍රයන් විශේෂඥ දැනුම ඇති පුද්ගලයෙකු ලවා සමාලෝචනය හා එහි අන්තර්ගතය වැඩි දියුණු කර ගත යුතුව ඇත. එබැවින් ඉදිරියේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මඟින් සුදුසු පුද්ගලයෙකු හෝ කණ්ඩායකමක් පත් කර ඒ කමිටුව මඟින් මෙම කෙටුම්පත් සකස් කිරීම අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. | 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ නියාමන සභාව ඉටු කළ යුතු පනතේ II පරිච්ඡේදයේ 11 (ඊ) වගන්තිය අනුව අයනීකාර විකිරණයෙන් ආරක්ෂා වීම, ප්‍රභවයන් සහ වෙනත් විකිරණශීලි ද්‍රව්‍යයන්හි ප්‍රවේසම හා සුරක්ෂිතතාවය සහ විකිරණශීලි අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සහ ක්‍රමෝපායක් සකස් කිරීම කළ යුතුය. |
| (iv) පනතේ 11 (එ) වගන්තිය අනුව සභාවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍යයයි සභාව අදහස් කරන වෙනත් කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම සභාවේ කර්තව්‍ය විය යුතුය. ඒ අනුව ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන කිරිපිටි සියල්ල විකිරණශීලිභාවයෙන් තොර ද යන්න නියමනය කිරීම ශ්‍රී ලංකා පරමාණුක | නියාමන සභාව ප්‍රධාන වශයෙන් වගකිව යුත්තේ මේ සම්බන්ධව නීති පැනවීමට බවත් එම නීතිය දැනට බලපැවැත්වෙන අතර එම නීති ප්‍රකාරව පරමාණුක බලශක්ති මණ්ඩලයේ විශ්ලේෂණ වාර්තා ලැබීමෙන් පසු කිරිපිටි වෙළඳපලට නිකුත් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලක වෙත අනුමැතිය ලබා දීම සිදු කරයි. කිරිපිටිවලින් නියැදි ගැනිම, ගතයුතු නියැදි ප්‍රමාණය, නියැදි ලබා ගත යුත්තේ කවුරුන්ද යනවග සහ කිරිපිටි බහාලුම් නිදහස් කළ යුත්තේ කුමන ආකාරයට ද | ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන කිරිපිටි සියල්ල විකිරණශීලිභාවයෙන් තොර ද යන්න නියාමනය කිරීම ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ වගකීමක් වන අතර එය 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ නියාමන සභාව ඉටු කළ යුතු කාර්යයන් යටතේ පනතේ II පරිච්ඡේදයේ 11 (එ) වගන්තිය ප්‍රකාරව ප්‍රමාණවත් පරිදි සිදු කළ යුතුය. |

බලශක්ති නියාමන සභාවේ වගකීමක් වේ. එහෙත් ආනයනය කරනු ලබන සියළුම කිරිපිටි තොග විකිරණ අපද්‍රව්‍යයන්ගෙන් තොර බවට තහවුරු කිරීමේ දී නියාමන සභාව ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

යනවග සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන් එවකට පරමාණුක බලශක්ති අධිකාරියේ ඉහළ නිලධාරීන්, ආනයනකරුවන්ගේ නියෝජිතයින් සමඟ පැවැත් වූ සාකච්ඡාවකින් පසු දැනට පවතින ක්‍රමවේදය අනුව නියැදි ගැනීමටත්, පරීක්ෂා කිරීමටත් එකඟ වී ඇත. ඒ නියැදි ගැනීමේ ක්‍රියාවලිය හා නියැදි ලබා ගැනීමේ ප්‍රමාණය විද්‍යාත්මක වශයෙන් නිවැරදිය.

වෙළඳපොලේ තිබෙන ආනයනික කිරිපිටි නියැදි එකතු කර පරීක්ෂා කර වාර්තා තබා ගැනීම පරමාණුක බලශක්ති මණ්ඩලයට පවරා ඇති අතර මේ සම්බන්ධව මීට කලින් පැවති රැස්වීමක දී මණ්ඩලය එසේ පරීක්ෂා කර වාර්තා තබා ගන්නා බවද දන්වන ලදී.

විකිරණ පරීක්ෂාව සඳහා ඉදිරිපත් කර ඇති නියැදිවලට අදාළ කිරිපිටි තොග අදාළ පරීක්ෂාවන් සිදු කිරීමට පෙර ආහාර පරීක්ෂක ඒකකය මඟින් විකිරණ නොමැති බව නිර්දේශ කර ඇති බවට අපට සාක්ෂි ලැබී නැත.

කිරිපිටි සඳහා ලංකාවේ බලධාරියා වන්නේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමා වන අතර ඔහු විසින් මේ සම්බන්ධව තීරණ ගනු ලබයි. නියාමන සභාවට පැවරී ඇත්තේ කිරිපිටි එවිය යුතු නියැදි ප්‍රමාණය දැනුම් දීමත්, නියැදි ලැබීමෙන් පසු ඒවා නිසිලෙස විකිරණය සඳහා පරීක්ෂා කිරීමෙන් පසු පරීක්ෂණ වාර්තා සලකා බලා එම කිරිපිටි වෙළඳපොලට මුදාහැරීමට අවශ්‍ය අනුමැතියන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ලබා දීමත් පමණි.

| | | |
|---|---|---|
| (ආ)ශ්‍රී ලංකාවේ භාවිතා වන අධිවිකිරණශීලී ප්‍රභව සුරක්ෂිත කිරීම සඳහා භෞතික ආරක්ෂණ පද්ධති ලබා දී ඇති ආයතන 13 ක් සඳහා සුරක්ෂිතතා සිද්ධීන් සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීම පහසු කිරීම සඳහා ජාතික විකිරණශීලී සුරක්ෂිතතා සිද්ධි මධ්‍යස්ථානයක් කටුකුරුන්ද විශේෂ කාර්ය බලකාය පුහුණු පාසලේ පිහිටුවා ඇත. මෙම මධ්‍යස්ථානයේ ඉදිරි මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යාම සඳහා ශ්‍රී ලංකා පොලිසීය, විශේෂ කාර්ය බලකාය, නියාමන සභාව හා වෙනත් පාර්ශවකරුවන් අතර අවබෝධතා ගිවිසුමක් සකස් කිරීම අත්‍යවශ්‍ය කාරණයක් වුවත් මෙම වාර්තාව නිකුත් කරන දින දක්වාම අවබෝධතා ගිවිසුමකට එළඹීමට නියාමන සභාව අපොහොසත් වී තිබුණි. | අවබෝධතා ගිවිසුමේ මූලික කෙටුම්පතක් සකස් කර ඇති අතර මේ වන විට එය සමාලෝචනය සඳහා අදාළ පාර්ශව වෙත යැවීමට දැනට කටයුතු කරමින් පවතී. තවද මෙය පාර්ශව කීපයක් සමඟ අත්සන් කළ යුතු අවබෝධතා ගිවිසුමක් නිසා හා විකිරණ සුරක්ෂිතතාව සම්බන්ධව කරුණු හොඳින් අධ්‍යනය කර මෙම කෙටුම්පත සම්පූර්ණ කළ යුතුය. මීට අමතරව කටුකුරුන්දේ පිහිටි ජාතික විකිරණශීලී සුරක්ෂිතතා සිද්ධි මධ්‍යස්ථානය සමඟ අනෙක් ආයතනවල සවි කර ඇති ආරක්ෂණ පද්ධති සම්බන්ධතා අවසන් වීමට මාස 06 ක කාලයක් ගත වන නිසා මෙම කාලය තුළ අවබෝධතා ගිවිසුම් අවසන් කළ හැකි බව දැනුම් දෙමි. | ජාතික විකිරණශීලී සුරක්ෂිතතා සිද්ධි මධ්‍යස්ථානයේ ඉදිරි මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යාම සඳහා ශ්‍රී ලංකා පොලිසීය, විශේෂ කාර්ය බලකාය, නියාමන සභාව හා වෙනත් පාර්ශවකරුවන් අතර අවබෝධතා ගිවිසුමකට එළඹිය යුතුය. |
| (ඇ)ශ්‍රී ලංකාවේ භාවිතා වන අධිවිකිරණශීලී ප්‍රභව සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව, ඇමරිකා එක්සත් ජනපද ශක්ති දෙපාර්තමේන්තුවේ ගෝලීය ද්‍රව්‍ය සුරක්ෂිතතා වැඩසටහන (GMS) හා සම්බන්ධ වෙමින් | GMS ව්‍යාපෘතිය යටතේ වෙනත් ආයතනවලට ලබා දී ඇති භෞතික ආරක්ෂක පද්ධති ක්‍රියාත්මක කිරීම, එම අදාළ ආයතනය ඇමෙරිකා එක්සත් ජනපදයේ බලශක්ති දෙපාර්තමේන්තුව යටතේ ඇති ජාතික න්‍යෂ්ටික සුරක්ෂිතතා පරිපාලන ආයතනය විසින් නම් කර ඇති විද්‍යාගාරයක් සහ අදාළ ආයතනයේ න්‍යෂ්ටික ආරක්ෂා පද්ධති ක්‍රියාත්මක කිරීමට | ඇමරිකා එක්සත් ජනපදයේ බලශක්ති දෙපාර්තමේන්තුව, අදාළ කොන්ත්‍රාත්කරු සමග සම්බන්ධ වී භෞතික ආරක්ෂණ පද්ධති ලබා දීම සිදු කිරීමට අදාළව, නියාමන සභාව වෙත නැවත තොරතුරු වාර්තා ලබා ගැනීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතුය. |

සියලු අධිවිකිරණශීලී ප්‍රභව භාවිතා වන ස්ථාන සඳහා භෞතික ආරක්ෂණ පද්ධති ලබා දීමට කටයුතු කරයි. මෙම කටයුත්ත සඳහා කොන්ත්‍රාත්කරුවන් සොයා ගැනීම, මිල ගණන් කැඳවීම හා ඔවුන්ට කොන්ත්‍රාත් පැවරීම යන සියළු කාර්යයන් ඇමරිකා එක්සත් ජනපදයේ බලශක්ති දෙපාර්තමේන්තුව මඟින් සිදු කරයි. ශ්‍රී ලංකාව තුළ ආරක්ෂණ පද්ධති ලබා දිය යුතු ආයතන සම්බන්ධව ඇමරිකා එක්සත් ජනපදයේ බලශක්ති දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කිරීම නියාමන සභාව විසින් සිදු කරන අතර ඇමරිකා එක්සත් ජනපදයේ බලශක්ති දෙපාර්තමේන්තුව, අදාළ කොන්ත්‍රාත්කරු සමග සම්බන්ධ වී භෞතික ආරක්ෂණ පද්ධති ලබා දීම සිදු කරයි. එසේ වුවත් මෙම ආරක්ෂණ පද්ධති ලබා දීම සම්බන්ධව, නියාමන සභාව වෙත නැවත තොරතුරු වාර්තා ලබා ගැනීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

කොන්ත්‍රාත්තුව ලබා දී ඇති කොන්ත්‍රාත්කරු අතර සිදු වන අතර නියාමන සභාව විසින් කරනු ලබන්නේ ආරක්ෂණ පද්ධති ලබා දිය යුතු ආයතනය හා ඇමෙරිකා එක්සත් ජනපදයේ අදාළ විද්‍යාගාරය අතර සම්බන්ධීකරණය කිරීම පමණි. මෙහිදී අදාළ ආයතනය විසින් මෙම විද්‍යාගාරය සමඟ ඍජුව ම භෞතික ආරක්ෂණ පද්ධතිය ලබා ගැනීම සම්බන්ධව ඇති සියළුම ලිපිලේඛන කටයුතු කරන අතර අදාළ කොන්ත්‍රාත්කරු සමඟ ද එම ආයතනය ඍජුව ම සම්බන්ධ වී වැඩකටයුතු කරනු ලබයි.